# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/08 - 2022 නොවැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2022.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී.5/2007(i)

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව සහ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 24 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2022 අංක 02 දරන ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතිය නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග මගින් 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7 වන සහ 9 වන වගන්තිවල කාර්ය සඳහා ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිත කිරීම සඳහා බලය ලබාදීම සහ පහසුකම් සැලසීම කළ යුතු ය.

3. (මෙහි මින්මතු "සුබසාධක ප්‍රතිලාභ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන) 2022 ඔක්තෝබර් මස 20 වැනි දින අංක 2302/23 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2022 අංක 1 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන්

තෝරා ගැනීම) නියෝග යටතේ පිහිටුවනු ලැබූ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම සඳහාත් එම නියෝගවල කාර්ය සඳහා ලේඛන හෝ වාර්තා නිර්මාණය කිරීම, ගොනු කිරීම, සැකසීම, සුරක්ෂිතව රඳවා තබාගැනීම, බෙදාගැනීම හෝ නිකුත් කිරීම කරනු ලැබීම සඳහාත් මණ්ඩලය විසින් සහ සුබසාධක ප්‍රතිලාභ නියෝග යටතේ පිහිටුවනු ලැබූ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකක විසින්, ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිත කරනු ලැබිය යුතු ය.

4. බලයලත් නිලධරයන් විසින්, මේ නියෝගවල කාර්ය සඳහා 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ සුබසාධක ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කරනු ලබන තැනැත්තන් පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රය භාවිත කරනු ලැබිය යුතු ය.

5. 4 වන නියෝගය යටතේ බලයලත් නිලධරයන් විසින් ලබා ගනු ලබන තොරතුරු සහ සුබසාධක ප්‍රතිලාභ නියෝග යටතේ යම් ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශනයේ සපයා ඇති තොරතුරු, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවනු ලැබූ අදාළ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකවල ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ආකාරයෙන් ගොනු කිරීම සහ සුරක්ෂිතව රඳවා තබා ගැනීම කළ යුතු අතර සුබසාධක ප්‍රතිලාභ නියෝගවල කාර්ය සඳහා එක් එක් ඉල්ලුම්කරුවකුට හඳිසි ප්‍රතිචාර කේතයක් (QR කේතය) ලබා දිය යුතු ය.

6. කොමසාරිස්වරයා විසින් සහ එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටුවනු ලැබූ සෑම සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයක බලයලත් නිලධරයන් විසින්, 5 වන නියෝගයේ සඳහන් කර ඇති ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා පහත දැවෙන ආකාරයට සුරක්ෂිතව පවත්වාගෙන යනු ලබන බවට වග බලාගත යුතු ය. :-

(අ) පෙළ දත්ත සහ රූපමය දත්ත යන දෙවර්ගයෙන් ම ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චිතව ම දක්වා ඇති ආකාරයට ලේඛනවල රූප පරිලෝකනය කිරීම මගින් සහ දත්ත ග්‍රහණය කිරීම සහ දත්ත ඇතුළත් කිරීමේ කාර්ය පටිපාටි මගින් ;

(ඇ) මණ්ඩලය විසින් ලිඛිතව බලයලත් නිලධරයන් වෙත ප්‍රවේශය ලබාදිය යුතු ය.

7. ඉලෙක්ට්‍රොනික ලේඛනයක සහ ඉලෙක්ට්‍රොනික වාර්තාවක රහස්‍යභාවය, සත්‍යවත්භාවය සහ ඒකාග්‍රතාවය ආරක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන පාලන ක්‍රියාවලිය සහ කාර්ය පටිපාටි පහත දැක්වෙන පරිදි විය යුතු ය. :-

(අ) සේවා පරිගණකවල භෞතික ආරක්ෂාව ඇතුළුව මණ්ඩලයේ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයන්හි සේවා පරිගණකවල ගබඩා කර ඇති සියලු දත්ත, සේවා පරිගණක පද්ධති සහ තොරතුරු පද්ධති ජාලය කලින් කල නිශ්චය කරනු ලැබිය යුතු ආරක්ෂිතව ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සහිත පද්ධති කළමනාකරුවකුගේ අධීක්ෂණය යටතේ ආරක්ෂිතව පවත්වාගෙන යනු ලැබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින්, ලිඛිතව බලය දෙනු ලැබූ නිලධරයන් විසින් පමණක් ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා නිර්මාණය කිරීම, සංස්කරණය කිරීම, බැලීම සහ හුවමාරු කර ගැනීම කරනු ලැබිය යුතු ය. ;

(ඇ) මණ්ඩලය විසින්, කලින් කලට නිශ්චිතව දක්වා ඇති තොරතුරු සුරක්ෂිතතා පාලන කාර්ය පටිපාටිය මගින් බලයලත් නිලධරයන් වෙත ප්‍රවේශය ලබාදිය යුතු ය ;

(ඈ) පාලනය සහ අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා බලයලත් නිලධරයන් වෙත සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයන්හි විවිධ කාර්ය භූමිකා පවරනු ලැබිය යුතු ය ;

(ඉ) දත්ත ඇතුළත් කිරීමේ දෝෂ අවම කර ගැනීම සඳහා සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතියේ රඳවා තබා ගත් දත්ත අවස්ථා කිහිපයක දී වලංගු කිරීම, සත්‍යාපනය කිරීම සහ නිවැරදි කිරීම සිදු කරනු ලැබිය යුතු ය. යම් දෙනු ලබන අවස්ථාවක දී, දත්ත සත්‍යාපනය කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයන්හි බලයලත් නිලධරයන් වෙත මූලාශ්‍ර ලේඛනවල පරිලෝකනය කරන ලද රූප ලබා ගැනීමට ඉඩ සලස්වනු ලැබිය යුතු ය ;

(ඵ) සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයන්හි යම් බලයලත් නිලධරයකු විසින් එම පද්ධතියේ ඇති යම් දත්තයකට යම් වෙනසක් සිදු කරනු ලබන්නේ නම්, එය සංස්කරණය කරන ලද ක්ෂේත්‍ර, පරිශීලක හඳුනාගැනීමේ නාමය, දිනය සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයන්හි වාර්තා කරනු ලැබිය යුතු අතර එම තොරතුරු මණ්ඩලය විසින් වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ට) මණ්ඩලය විසින්, සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකවලින් වාර්තා උත්පාදනය කළ හැක්කේ යම් කාර්යයක් සඳහා ද එම කාර්යය බලයලත් නිලධරයන් වෙත දැනුම් දිය යුතු ය ;

(ඨ) බලයලත් නිලධරයන් විසින්, සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයන්හි ඇති දත්ත මෙන්ම ඉලෙක්ට්‍රොනික වාර්තා සහ ඉලෙක්ට්‍රොනික ලේඛන දෛනිකව සහ සතිපතා උපස්ථනය කරනු ලැබිය යුතු අතර, එකී උපස්ථනය කරන ලද තොරතුරු ගබඩා කරනු ලැබිය හැකි ස්ථානය සහ ආකාරය නිශ්චිතව දැක්විය යුතු ය.

8. මේ නියෝගවල -

"බලයලත් නිලධරයා" යන්නෙන්, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 6 වන වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ නියෝගවල කාර්ය සඳහා පත් කරනු ලැබූ නිලධරයකු අදහස් වේ;

"මණ්ඩලය" යන්නෙන්, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ පිහිටුවනු ලැබූ මණ්ඩලය අදහස් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන්, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරයා අදහස් වේ ;

"ප්‍රාදේශීය ලේකම් කාර්යාලය" යන්නට, 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"ඉලෙක්ට්‍රොනික ලේඛනය" සහ "ඉලෙක්ට්‍රොනික වාර්තා" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ එකී අර්ථ නිරූපණයන්ට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"හදිසි ප්‍රතිචාර කේතය (QR කේතය)" යන්නෙන්, යම් පරිගණකයක්, ජංගම දුරකතනයක් හෝ ඒ හා සමාන උපකරණයක් යොදා ගනිමින් යම් ලේඛනයක ඇතුළත් තොරතුරුවල අන්තර්ගතයන් සත්‍යායනය කිරීමට සහ ඒවායෙහි සත්‍යවත්භාවය සහ ඒකාග්‍රතාවය සනාථ කිරීමට භාවිතා කරනු ලැබිය හැකි කේතයක් අදහස් වේ ;

"සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතිය" යන්නෙන් සුබසාධක ප්‍රතිලාභ නියෝග යටතේ පිහිටුවනු ලැබූ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතිය අදහස් වේ ;

"සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකය" යන්නෙන්, සුභසාධක ප්‍රතිලාභ පනතේ කාර්ය සඳහා තොරතුරු නිර්මාණය, උත්පාදනය, යැවීම, ලැබීම, ආචයනය, ප්‍රතිනිෂ්පාදනය, ප්‍රදර්ශනය, වාර්තාගත කිරීම හෝ සැකසීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක, සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ නියෝග යටතේ පිහිටුවනු ලැබූ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකය අදහස් වේ.

උපලේඛනය

(4 වන නියෝගය)

සුභසාධක ප්‍රතිලාභ ලැබීමට ඉල්ලුම්කරන තැනැත්තන් හඳුනා ගැනීම - 2022

ආදර්ශ අයදුම්පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :- ..........................................................................................................

02. ලිපිනය :- ..........................................................................................................

03. දුරකතන අංකය :- ..........................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

වෙනත් හැඳුනුම්පත් අංකයක් වේ නම් :- | | | | | | | | | | | | |

05. පළාත:- [ ] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- [ ] සමෘද්ධි කළාපය :- [ ]

දිස්ත්‍රික්කය :- [ ] ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- [ ]

06. දැනට ඔබ යම් සුබසාධක යෝජනා ක්‍රමයක ප්‍රතිලාභ ලබන්නේ නම්, එම සුබසාධක යෝජනා ක්‍රමයේ නම/ නම් :-

(1) .......................... වටිනාකම (රුපියල්) [ ]

(2) .......................... වටිනාකම (රුපියල්) [ ]

07. පවුලේ සිටින මුළු සාමාජිකයින් සංඛ්‍යාව [ ]

08. ඔබ කුමන හෝ සුබසාධක යෝජනා ක්‍රමයක පොරොත්තු ලේඛනයේ සිටින්නේ නම්, එම යෝජනා ක්‍රමයේ නම/නම් (1) .......................... (2) ..........................

09. ඔබ නව අයදුම්කරුවෙක් ද? අ. ඔව් [ ] නැත [ ]

ඔබ නය අයදුම්කරුවෙක් නම් ඉල්ලුම් කරන යෝජනා ක්‍රමයේ නම :- ....................................................

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. අවශ්‍ය කරන වැඩිදුර තොරතුරු ක්ෂේත්‍ර දත්ත රැස් කරන අවස්ථාවේ දී නිවැරදිව ලබාදෙන බව ද, අසත්‍ය තොරතුරු සැපයම සුබසාධක ප්‍රතිලාභ හිමිකම් නොලැබීමට හේතු වන බව ද දනිමි.

.......................... ..........................

අයදුම්කරුගේ අත්සන දිනය

ඉහත සඳහන් කරුණු නිවැරදි බව සහතික කරන අතර .......................... ගේ අයදුම්පත සුබසාධක ප්‍රතිලාභ වැඩසටහනට ඇතුළත් කිරීමට නිර්දේශ කරමි.

.................................................... ..........................

ග්‍රාම නිලධාරි/ සමෘද්ධි සංවර්ධන නිලධාරි/ ආර්ථික සංවර්ධන නිලධාරි/ සමාජ සේවා නිලධාරි/ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි (නිල මුද්‍රාව සහ අත්සන යොදන්න.) දිනය

EOG - 11-0341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.